## WEATHER FORECAST FOR 17th JULY 2019

**(Issued at 05.30 a.m. on 17th July 2019)**

**Showery and windy conditions are likely to enhance over South-western part of the island till 19th July 2019. Cloudy skies can be expected in the southern half of the island today.**

Fairly strong gusty winds up to (40-50) kmph are likely over the Western, Southern and Sabaragamuwa provinces and along the North-western coastal areas.

Showers or thundershowers will occur at times in Sabaragamuwa, Central, Western, Southern and North-Western provinces. Showers or thundershowers will occur at several places in Uva, Eastern and North-Central provinces.

Heavy falls about 100 mm are likely at some places in Western, Central and Sabaragamuwa provinces and in Galle and Matara districts.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයිනේ, නිරිත දිග කොටසේ වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීමක් ජූලි මස 19 වන දා දක්වා බලාපොරොත්තුවේ. අද දිනයේදී දිවයිනේ දකුණු අර්ධය වලාකුලින් බරව පවතී.

බස්නාහිර, දකුණු සහ සබරගමුව පළාත්වලත් වයඹ වෙරළබඩ ප්‍රදේශවලත් විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ දක්වා තරමක් තද සුළං ද ඇති විය හැක.

සබරගමුව, මධ්‍යම, බස්නාහිර, දකුණු සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඌව, නැගෙනහිර සහ උතුරුමැද පළාත්වල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

බස්නාහිර, මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තද වර්ෂාපතනයන් අපේක්ෂා කල හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 17th July 2019)

**Showery and windy conditions are likely to be enhanced in the Western, South-western and Southern sea areas of the island till 19th July 2019.**

Showers or thundershowers will occur at times in the sea area off the coast extending from Puttalam to Hambanthota via Colombo and Galle. Showers or thundershowers may occur at a few places in the other sea areas around the island in the evening or night.

Winds will be South-westerly and speed will be 30-40 kmph in the sea areas around the island.

**The sea area extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota will be very rough at times as the wind speed can increase up to 60-70 kmph at times.**

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය

**2019 ජූලි මස 17 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

දිවයිනට බස්නාහිර, නිරිත සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීමක් ජූලි මස 19 වන දා දක්වා බලාපොරොත්තුවේ.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 60-70 දක්වා වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.

ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

S. [signature]

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date 2019/07/17
Time 05.58 hrs
[signature]
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE